Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10 | විෂය - කෘෂි හා ආහාර තාක්ෂණය | සතිය - ජූලි 05 සතිය

01) ගෙවතු වගාවකදී වගා කර ඇති බෝග වර්ග පහත දක්වා ඇත.
(අඹ, වැටකොළු, බටු, මිරිස්, තේක්ක, කිරිඅල, පලා වර්ග, බතල, අන්නාසි, බඩඉරිඟු)

1. (අ) ඉහත බෝග අතරින් පළතුරු බෝග දෙකක් නම් කරන්න.
   (ආ) මෙම බෝග අතරින් පොඒසියේ හා සොලනේසියේ බෝග එක බැගින් නම් කරන්න.

2. (අ) වැටකොළු අයත්වන ශාක කුලය නම් කරන්න.
   (ආ) එම කුලයට අයත් වෙනත් බෝග දෙකක් සඳහන් කරන්න.

3. (අ) ශාක වර්ගීකරණය ලොවට හඳුන්වා දුන් විද්‍යාඥයා කවුද ?
   (ආ) බෝග වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න.

02) බෝග වර්ධනය, වැඩි ඵලදාව, පාංශු සංරක්ෂණය සඳහා නිවැරදි බිම් සැකසීම වැදගත් වේ.

1. (අ) මූලික බිම් සැකසීම යන්න අර්ථ දක්වන්න.
   (ආ) එහි ප්‍රධාන පියවර දෙකක් ලියන්න.

2. (අ) ශාක පසෙන් උදුරා අස්වනු නෙලා ගනු ලබන බෝග සහ කුඩා මූල පද්ධති සහිත බෝග සිටුවීමේදී බහුලව භාවිතා කරන පාත්ති ක්‍රමය කුමක්ද ?
   (ආ) ඒ සඳහා භාවිතා කළ හැකි උපකරණය නම් කරන්න.

3. (අ) භාවිතා කරන අවස්ථාන අනුව බිම් සැකසීමේ උපකරණ වර්ගීකරණ වගුවට පහත සඳහන් උපකරණ ඇතුළත් කර දක්වන්න.

ගැමි ලී නඟුල, හෝව වර්ග, අත් පෝරුව, රොටවේටරය, උදළු මුල්ලුව, අත් ඉස්කෝප්පය

| ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ | ද්විතීක බිම් සැකසීමේ උපකරණ | අතුරු යත්ගැමේ උපකරණ |
|---|---|---|
| | | |

(ආ) ක්‍රමවත් බෝග සංස්ථාපන උපකරණ භාවිත කිරීමේ වාසියක් සඳහන් කරන්න.